සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

**පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය**

# 2023

**නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන**
**"අදිති"**

# 4

**I පත්‍රය**

පැය 01 යි

විභාග අංකය ...............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |


| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

**ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**


**<u>නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.</u>**

- ❖ වෙනස් රූපය තෝරන්න.

01).



02).



- ❖ **පහත කවිය ඇසුරින් 3,4 ප්‍රශ්නවල පිළිතුරු තෝරන්න.**

***පලා පැහැය හැම කල්හිම***
***රැඳී දිලෙන පොළොවේ***
***ඉවත දමන දඬුව වුවද***
***දලු ලා යළි පැළවේ***

03). කවියේ ''පලා පැහැය'' ලෙස හඳුන්වන්නේ,


සුදු පාට ය.

i. දුඹුරු පාට ය.
ii. කොළ පාට ය.

04). කවියෙන් විස්තර වන්නේ,


i. පොළවේ සාරවත් බව.
ii. පොළොව කොළ පාට බව.
iii. ඉවත දමන දඬු ගැන.

05). පහත දැක්වෙන කඩදාසිය කිහිප වරක් නවා කළු පාටින් සළකුණු කර ඇති කොටස කපා ඉවත් කළ විට ලැබෙන රූපය වන්නේ,




i. ii. iii

06). පහත දැක්වෙන්නේ සමචතුරස්‍රාකාර කඩදාසියක් කිහිප වරක් නවා එක් කතුරු පහරකින් කපා ගත් හැඩතලයකි. මෙම හැඩතලය ලබා ගැනීමට කඩදාසිය කී වරක් නැමිය යුතු ද?



i. දෙවරකි. ii. තුන්වරකි. iii. හතරවරකි.

❖ **පහත තොරතුරු උපයෝගී කරගෙන 7,8 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**



රු. 260.00 කි. රු. 270.00 කි.


07).  හී අගය කිය ද?

i. රු.70.00 කි. ii. රු.60.00 කි. iii. රු.50.00 කි.

08).  වටිනාකම තෝරන්න.


i. රු. 30.00 කි. ii. රු. 40.00 කි. iii. රු. 50.00 කි.

09). පහත දැක්වෙන්නේ 20$l$ අල්ලනු ලබන භාජන අටකි. ළමයෙක් පළමු භාජනයෙන් ජලය පිරවීම අරඹා එහි භාගයක් පිරෙන විට දෙවන භාජනය පිරවීම ඇරඹීය. ඒ ආකාරයටම භාජන අටම පුරවයි. මෙම එක් භාජනයක් පිරවීමට මිනිත්තු දහයක් ගත වේ. භාජන සියල්ල පිරවීමට ගතවන කාලය සොයන්න.



i. මි. 80 ii. මි. 45 iii. මි. 40

10). අඳුරු කර ඇති කොටස මෙන් මුළු රූපය කොපමණ විශාල වේද ?



i. 6 ගුණයකි.

ii. 10 ගුණයකි.

iii. 12 ගුණයකි.

11). ප්‍රශ්න පත්‍රයක් සඳහා ප්‍රශ්න 25 ක් ලැබේ. මෙහි නිවැරදි සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු 04 ක් ලැබෙන අතර වැරදෙන සෑම ප්‍රශ්නයකට ම ප්‍රශ්නයට හිමි ලකුණට අමතරව තවත් ලකුණු දෙකක් අඩු කරනු ලබයි. ළමයෙක් ලකුණු 70 ක් ලබා ගන්නා ලදී නම් එම ළමයා ප්‍රශ්න කීයකට නිවැරදිව පිළිතුරු සැපයිය යුතු ද ?

i. 15 ii. 20 iii. 23


12). වට්ටියක පෙති හතරක් ඇති රත්මල් පහක් ද පෙති පහක් ඇති අරලිය මලක් ද, පෙති හයක් ඇති සල් මලක් ද තිබේ. කිත්මා එම මල්වට්ටිය දෙස බලා මෙසේ කියයි. මෙහි ඇති සෑම මලකටම පෙති හතරක් ඇත. කිත්මාගේ මෙම ප්‍රකාශය,

i. වැරදිය. ii. නිවැරදිය. iii. ස්ථිරව ම කිව නොහැකිය.

13). කෙවින්ගේ අම්මාට දුරකථන ඇමතුමක් ලැබිණි. ඒ අම්මාගේ අයියාගේ දුවගෙන් ය. එම ඇමතුම ලබාදුන් තැනැත්තිය කෙවින්ගේ කවු ද?

i. නෑනා ii. සහෝදරිය iii. ලේලි ය.

14.) පහත රූපයේ තවත් 4/10 ක් පාට කිරීමට පාට කළ යුතු කොටු ගණන වන්නේ,



i. 1 ii. 2 iii. 3

15). නිවාසාන්තර ක්‍රීඩා තරඟයක් සඳහා සහභාගී වූ සිසුන් 50 දෙනෙකුගෙන් 35 දෙනෙක් කළු පාවහන් පැළඳ සිටිති. 25 දෙනෙක් කළු තොප්පි පැළඳ සිටිති. ඒ අනුව කළු තොප්පි සහ කළු පාවහන් දෙකම පැළඳ සිටින සිසුන් ගණන තෝරන්න.

i. 10 ii. 20 iii. 30

❖ **පහත තොරතුරු අනුව 16, 17 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**

**අඩු → වැඩි** **වැඩි ← අඩු**

**අඹ ← අන්නාසි** **අන්නාසි → ඇපල්** **ඇපල් → අඹ**

16). ඉහත දක්වා ඇත්තේ වෙළඳපළක තිබූ පලතුරු පිළිබඳව විස්තරයයි. ඒ අනුව වැඩිම ප්‍රමාණයක් ඇති පලතුර කුමක් ද?

i. අන්නාසි ii. ඇපල් iii. අඹ


17). ඉහත තොරතුරු අනුව පලතුරු අවරෝහණ පටිපාටියට පෙළගැස්සූ නිවැරදි පිළිතුර තෝරන්න.

i. අඹ, අන්නාසි, ඇපල්

ii. ඇපල්, අන්නාසි, අඹ

iii. අඹ, ඇපල්, අන්නාසි

❖ පහත දැක්වෙන්නේ ගමක්, ගමේ පන්සලත්, ගමේ වැවත් සහ නෙලුම් මල් දැක්වීමට අඳින ලද සටහනකි. ඒ ඇසුරින් 18, 19 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




18). මෙහි පන්සල දක්වන අක්ෂරය වන්නේ,

i. A   ii. B   iii. D

19). නෙලුම්මල් දක්වන අක්ෂරය වන්නේ,

i. B   ii. C   iii. D

❖ **පහත දැක්වෙන්නේ අධිවේගී මාර්ගයක් ඉදිකිරීම් කළ ආකාරයයි. ඉදිකිරීම 2015 වේ ජනවාරි මුලදී ආරම්භ කළේ නම්,**

| **පියවර** | **ගතවූ කාලය** |
|---|---|
| පළමු | අවුරුදු 01 යි. |
| දෙවන | පළමු පියවර මෙන් දෙගුණයයි |
| තෙවන | දෙවන පියවර මෙන් භාගයයි. |

20). ඉදිකිරීම අවසන් වන වර්ෂය සොයන්න.

i. 2018   ii. 2019   iii. 2020

21). ඉදිකිරීම සඳහා ගත වූ මුළු කාලය කොපමණ ද?

i. වසර 3   ii. වසර 4   iii. වසර 5

❖ **පහත දැක්වෙන ප්‍රකාශ වලින් සෑම විටම සත්‍යවන ප්‍රකාශය තෝරන්න.**

22). i. ඉර මුදුන් වන්නේ දහවල් 12 ට ය.

ii. සෑම බිත්තරයක් ම සුදු පාටය.


iii. සෑම ඝනවස්තුවක ම පෘෂ්ඨ එකකි.

23). i. පැපොල් ගසේ අතු නොබෙදෙයි.

ii. කෝමාරිකා ගසේ මල් නොපිපෙයි


iii. බත්කූරා ජලයේ බිත්තර දමයි.

24). සංඛ්‍යා රටාව තේරුම් ගෙන හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව තෝරන්න.




i. 25 ii. 28 iii. 33

25).



i. රූපය ii. රූපය iii. රූපය

ඉහත දක්වා ඇත්තේ විනිවිද පෙනෙන කඩදාසි වල ඇඳින ලද රූප තුනකි. එහි පළමු රූපය මත දෙවන රූපය ද, දෙවන රූපය මත තුන්වන රූපය ද, තබනු ලබයි. ඒ තබන සෑම අවස්ථාවක දී ම පළමු රූපය මත දෙවන රූපය තබන විට පළමු රූපය වටේ කොටු පේළියක් නොවැසේ එසේම දෙවන රූපය මත තුන්වන රූපය තබන විට ද දෙවන රූපයේ වටා කොටු පේළියක් නොවැසේ. එසේ නිර්මාණය වන නව රූපයේ අඳුරු නොවූ කොටු කීයක් ඉතිරිවේද ?

i. 36 ii. 26 iii. 20

❖ **පබළු වැලක පබළු අමුණා ඇත්තේ රතු පබළු දෙකක් කහ පබළු තුනක් නිල් පබළු දෙකක් යන ආකාරයට ය. නමුත් පබළු වැලේ අවසානයට නිල් පබළු පහක් එක පෙළට ඇත. පබළු වැලේ ඇති රතු පබළු ගණන 20 ක් නම්,**

26). පබළු වැලේ ඇති මුළු පබළු ගණන සොයන්න.

i. 75 ii. 73 iii. 70

27). පබළු වැලේ ඇති නිල් පබළු ගණන සොයන්න.


i. 20 ii. 23 iii. 25

28). වචන යෙදී ඇති රටාව තේරුම් ගෙන ඊළඟට ආ යුතු වචන තෝරන්න.

**මහරගම → මහගම → ගමරට →** රටල

i. හලාවත ii. ලුණුව iii. ධයරය

❖ **පහත දක්වා ඇත්තේ නගරයක මාර්ග සටහනකි. ඒ ඇසුරින් 29, 30 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




29). පූජා නගරය දෙසින් වට රවුමට ඇතුළු වන අයෙක් වම් අත පැත්තෙන් කැරකී බැංකු ප්‍රදේශයට ගියේ නම් ඔහු ගමන් කළේ කුමන දිශාවට ද?

i. උතුර ii. බස්නාහිර iii. නැගෙනහිර

30). බැංකු ප්‍රදේශයට ඇතුළු වන විට ඔහුගේ දකුණු අත පිහිටියේ කුමන දිශාවේ ද?

i. උතුර ii. දකුණ iii. නැගෙනහිර

31). වැරදි ලෙස දත්ත කවන ලද රොබෝවක් සෑම විටම ඉල්ලන සංඛ්‍යාවට එකක් අඩු සංඛ්‍යාව පෙන්වයි. නමුත් පෙන්වනු ලබන සංඛ්‍යා ඉතා නිවැරදිව ගුණකර පෙන්වයි. ළමයෙක් යම් සංඛ්‍යා දෙකක් ඉල්ලා ලැබුණු පිළිතුරු ගුණකරවයි. එවිට පිළිතුර ලෙස රොබෝවරයා 72 පෙන්නුවේනම් ළමයා රොබෝවරයාගෙන් ඉල්ලූ සංඛ්‍යා දෙක විය හැක්කේ,

i. 1 හා 9 ii. 9 හා 8 iii. 10 හා 9

❖ **32 හා 33 ප්‍රශ්නවල නිවැරදි ප්‍රකාශය තෝරන්න.**

32). i. 5 x 2 x 5 x 0 = 50
ii. 5 x 2 x 5 x 0 = 0
iii. 5 x 0 x 5 x 2 = 10


33). i. 1+11+111+1111 = 2234
ii. 1+111+11+1111 = 1234
iii. 1+1111+111+11 = 4231

34). පහත සිදුවීම් නිවැරදි අනුපිළිවෙළට සකසා ඇති පිළිතුර තෝරන්න.

I. කුඹුර මඩකලා
II. ගොයම් කැපුවා
III. වී වැපුරුවා
IV. ගොයම් පැළවුණා
V. කොළ පෑගුවා

i. I, III, IV, II, V ii. I, V, III, IV, II iii. III, I, IV, III, V

❖ **පහත දැක්වෙන ඝනවස්තුව A හා B රේඛාව දිගේ කපා වෙන් කරයි.**





35). කැපූ මුහුණතේ හැඩය කුමක් ද ?

i. වෘත්තාකාරයි. ii. චතුරස්‍රාකාරයි. iii. ත්‍රිකෝණාකාරයි.

36). මෙම ඝනවස්තුවේ යට කොටසේ ඇති මුහුණත් ගණන වන්නේ,

i. 5 ii. 4 iii. 3

37). මෙම රූපයේ දැකගත හැකි චතුරස්‍ර ගණන සොයන්න.



i. 20 ii. 60 iii. 150

38). දහම්සා අසනීප වූ විට වෛද්‍යවරයා ඇයට පැය හයකට වරක් පානය කරන ලෙස බෙහෙත් පෙති තුනක් දුන්නේ ය. ඇයට බෙහෙත් පෙති තුනම බී අවසන් වීමට ගතවන කාලය සොයන්න.

i. පැය 12 ii. පැය 18 iii. පැය 24

39). සිංහල හෝඩියේ අකුරු යෙදී ඇති පිළිවෙල අනුව (අකාරාදි) **'ඒ'** අක්ෂරය සහ **'ඕ'** අක්ෂර දෙක පිහිටා ඇත්තේ කවර ස්ථානවලද ?

i. 12 සහ 14 ලෙස ii. 13 සහ 16 ලෙස iii. 13 සහ 14 ලෙස

40). මම ශිෂ්‍යත්ව විභාගය ඉහළින් ම සමත්වන බව චතිල කියයි. මෙම ප්‍රකාශය සත්‍ය විය හැක. මෙයට හේතුව විය හැක්කේ,

i. ඔහුගේ තාත්තා 5 ශ්‍රේණියේ උගන්වන ගුරුවරයෙකු නිසා

ii. ඔහුගේ මාමා අධ්‍යාපන අධ්‍යක්ෂකවරයෙක් නිසා

iii. ඔහු ඉතා හොඳින් විභාගයට සූදානම්ව සිටින නිසා